*සැ. යු.-* (i) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2016 වර්ෂය සඳහා පොළොන්නරුව අධිකරණ කලාපයට අයත් ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල සහ දෙමළ භාෂාවෙන් පමණක් පළ වේ.

(ii) 2016.07.22 දින පළ වූ අංක 1977 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,978 - 2016 ජූලි මස 29 වැනි සිකුරාදා - 2016.07.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1346 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1356 |

*සැ. යු.-* අමීර් අලි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 මැයි මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 අගෝස්තු මස 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 අගෝස්තු මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)

2016 ජුනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1343- B 81082 — 5,403 (2016/07)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 අගෝස්තු මස 30 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජූලි මස 11 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
| --- | --- | --- | --- |
| බදුල්ල | වැලිමඩ | සිල්මියාපුර කොට්ඨාසයේ උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |

07-1102

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — රත්නපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 අගෝස්තු මස 29 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජූලි මස 11 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| රත්නපුර | ඉඹුල්පෙ | බලන්ගොඩ මූලික රෝහල් කොට්ඨාසයේ උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර |

07-1101

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 අගෝස්තු මස 30 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජූලි මස 11 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | අකුරණ | හාරිස්පත්තුව රඹුකේ ඇල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | අකුරණ | අකුරණ කුරුගොඩ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | අකුරණ | හාරිස්පත්තුව කොට්ඨාසයේ නිරුල්ල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

07-1103

---

**ශ්‍රී ලංකා පොලීසිය**

කාන්තා උප පොලිස් පරීක්ෂක තනතුර (සාමාන්‍ය)

ශ්‍රී ලංකා පොලීසියේ ආධුනික කාන්තා උප පොලිස් පරීක්ෂක තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06 යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ උඩින් තමා අයදුම් කරන තනතුර සඳහන් කර එය ලියා පදිංචි තැපෑලෙන් 2016 අගෝස්තු මස 29 දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 3,93,480 - 7 x 4,440 - 2 x 5,940 - 25 x 7,920 - රු. 6,34,440.00

2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි 11 වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිටය.

තව ද, මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබා දී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා හිමිවනු ලැබේ.

(*අ*) ජීවන වියදම් දීමනාව රු. 7,800 0

(ආ) දුෂ්කර දීමනාව රු. 2000 0
(ඇ) සංයුක්ත දීමනා-
(1) උතුරු නැගෙනහිර සේවය සඳහා රු. 12,000 0
(2) අනෙකුත් පළාත්වල සේවය සඳහා රු. 9,600 0
(ඈ) වෙනත් දීමනා -
(1) නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව රු. 250 0

(අ) නොමිලේ ගමන් පහසුකම්,

(ආ) නිලධාරිනියන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.)

(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(අ) *වයස් සීමාව* :

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-28 ත් අතර විය යුතු ය. එසේ වුව ද දැනට ශ්‍රී ලංකා පොලීසියේ රාජකාරියේ නියුතු පොලිස් නිලධාරියන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම්කළ හැක.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්* :

- අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 06කින් සමත්ව එම විෂයයන් 04ක් සඳහා සම්මාන සාමාර්ථ තිබිය යුතු අතර ඉන් 02ක් මාධ්‍ය භාෂාව හා ගණිතය විය යුතු ය. තව ද,

- අයදුම්කාරිය අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 03ක් සමත්වීම.

*සටහන 01*: ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් වශයෙන් ද, සලකා විභාග යෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02* : අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03*: වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) *ශාරීරික සුදුසුකම්* :

- උස අඩි 05 යි. අඟල් 04 (අවම),

*සටහන* : විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගී වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කාරියකගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඈ) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්.*— එක් ඇසක දෘෂ්ටිය 6/12 අඩු නොවිය යුතු ය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේනම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතු ය. යම් අයදුම්කාරියක් උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඉ) *අනෙක් සුදුසුකම්* :

❖ අයදුම්කාරිය අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් ශ්‍රී ලංකා පොලීසියේ සේවය කරන පොලිස් නිලධාරිනියන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

❖ අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කාරියන් සඳහා ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත්විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කාරියන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

මීටර් 1000 - මිනිත්තු 05 තත්පර 14

❖ යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කාරියන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කාරියන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

❖ ලිඛිත පරීක්ෂණය ප්‍රශ්නපත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

- වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතු ය.
- සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය කාලය පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය* :
අයදුම්කාරියන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය. වෛද්‍ය පරීක්ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්ෂණයෙන්

සමත් වූ අයදුම්කාරියන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය, ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වුවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. *පසුබිම් පරීක්ෂණය* :

(අ) අයදුම්කාරියන්ගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඇය හා ඇයගේ සමීප ඥාතීන්ගේ ද, ඇය ඇසුරු කරන්නන්ගේ යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කාරියන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :

- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරින්/නිලධාරිනියන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.

- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරින්/නිලධාරිනියන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරිනියන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් නතර කරනු ඇත.

09. *පත්වීමේ කොන්දේසි* :

❖ මෙම පත්වීම ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

10. *සේවා කොන්දේසි* :

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කාරියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝග යක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙළුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරිනියකම නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් සමත් විය යුතුවේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරිනීන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක පරිවාස සේවා කාලයක් ශ්‍රී ලංකා පොලීසියේ සේවය කළ යුතු වන අතර, මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔවුන්ගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙලුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(උ) ආධුනික කාන්තා උප පොලිස් පරීක්ෂකවරියන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.

(ඌ) ආධුනික කාන්තා උප පොලිස් පරීක්ෂකවරියන් පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික කාන්තා උප පොලිස් පරීක්ෂකවරියන් ශ්‍රී ලංකා පොලීසියේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කාරියන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතු ය.) :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික, (තිබේ නම් පමණක්),

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කාරිය තෝරා ගන්නා ලද්දේ නම් ඇය නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතු ය.

(ආ) අයදුම්කාරිය විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.—* පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

පොලිස්පති.

ආදර්ශ අයදුම්පත්‍රය

**ශ්‍රී ලංකා පොලීසිය**

**කාන්තා උප පොලිස් පරීක්ෂක තනතුර (සාමාන්‍ය)**

01. (අ) සම්පූර්ණ නම :————.
(පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතු ය.

(ආ) නම (මුලකුරු සමඟ) :————.

(ඇ) අයදුම් කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතු ය.)

03. පියාගේ සම්පූර්ණ නම :————.

04. අයදුම්කාරිය උපන් ස්ථානය :————.

උපන් ස්ථානයට අදාළ පොලිස් ස්ථානය :————.
පළාත :————.

05. (අ) වර්තමාන ලිපිනය :————.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඇ) ස්ථිර ලිපිනය :————.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය හා මැතිවරණ කොට්ඨාසය :————.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(ඊ) දුරකථන අංකය : නිවස :————. ජංගම :————.

06. (අ) ජාතිය :————.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.
* අයදුම්කාරිය :————.
* අයදුම්කාරියගේ පියා :————.
* අයදුම්කාරියගේ පිය පක්ෂයේ මුත්තා :————.
* අයදුම්කාරියගේ පිය පක්ෂයේ මී මුත්තා :————.

07. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)

වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)

අවුරුදු :————. මාස :————. දින :————.

08. උස : අඩි :————. අඟල් :————.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය) :————.

10. අතිරේක සුදුසුකම් :————. (සහතික පත්වල ඡායා පිටපත් ඇමිණිය යුතු ය)

11. විවාහක/අවිවාහක බව :————.

12. (අ) දැනට කරන රැකියාව :————.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකාවක් ද ? :————.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේ ද ? :———.

14. අයදුම්කාරිය ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් (ඥාතීන් නොවන) :

(අ) ———.

(ආ) ———.

15. ඔබ මීට පෙර පොලිස් සේවයේ සේවය කර තිබේ ද ? :———.

එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———.

16. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. :———.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. :———.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :———.

18. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලීසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

20. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................... මෙනවිය .................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
තනතුර (රබර් මුද්‍රාව සහිත).

තනතුර :———.

දිනය :———.

07-1071

---

## ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

### ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 02 සේවා ගණයේ ලඝුලේඛක තනතුර සඳහා බඳවා ගැනීම (විවෘත බඳවා ගැනීම) - 2016

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 02 සේවා ගණයේ පවතින ලඝුලේඛක තනතුරු 03 සඳහා සුදුස්සන් තෝරා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර ලේකම්, ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත, කොළඹ 10 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ ලඝුලේඛක තනතුර සඳහා" යනුවෙන් පැහැදිළිව සටහන් කළ යුතු ය. අයදුම්පත් කැඳවන අවසාන දිනය 2016.08.29 දින වේ.

*සටහන.-* ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයක් මගින් ලබා දෙන ලකුණු මත තෝරා ගනු ලබයි. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

2. *බඳවා ගන්නා ශ්‍රේණිය :*
III ශ්‍රේණිය

3. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරියෙකු වසර 03ක පරිවාස කාලයකට යටත් වන අතර, එම වසර 03 ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05ක් තුළ දී ලබා ගත යුතු ය. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව ලබාගත යුතු ය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

4. *වැටුප් පරිමාණය :*
මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව MN-1-2016, රු.27,140/- 10x300 - 11x350 - 10x495 - 10x660 රු. 45,540/- ක මාසික වැටුප් පරිමාණයක් හිමිවේ. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් තලය රු.15,924/- ක් වේ.

5. *සුදුසුකම් :*

(i) *අධ්‍යාපන සුදුසුකම් :*

(a) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත්ව තිබීම;

*සහ*

(b) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ii) *වෘත්තීය සුදුසුකම් :*
පිළිගත් ආයතනයක ලඝුලේඛනය පිළිබඳ මාස 06කට නොඅඩු කාලයක පාඨමාලාවක් හදාරා තිබීම හෝ අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී යතුරු ලියනය හා ලඝු ලේඛනය විෂය සඳහා සම්මාන සමාර්ථයක් ලබා තිබීම.

(iii) *පළපුරුද්ද* : අදාළ නොවේ.

6. *වයස් සීමාව* :
අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා උපරිම අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

7. *කායික සුදුසුකම් :*
දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යෝග්‍යවන යහපත් මානසික හා ශාරීරික සෞඛ්‍ය තත්වයකින් යුක්ත වීම හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට සුදුසු ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

8. *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(ii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

(iii) තනතුරේ බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

9. *වෘත්තීය පරීක්ෂණය :*
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ ලේකම් හෝ ඔහු/ඇය විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන පරීක්ෂණයක් මගින් ලකුණු ලබා දෙනු ලැබේ.

10. *වෘත්තීය පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන ක්‍රමය :*

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| ලඝුලේඛනය | 100 | 40% |
| යතුරු ලියනය | 100 | 40% |

11. *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :*

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. (ලකුණු ලබාදෙනු නොලැබේ.)

12. *අයදුම්පත්‍රය* :

(i) ඉල්ලුම්පත්‍රය සෙ.මී. 22 x 29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, 1 - 12 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 13 සිට අවසන්වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු ය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිළිව ඇතුළත් කළ යුතු ය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය, නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වන බවත්, වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම්පත්‍ර මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම්පතට අනුව සැකසිය යුතු ය. ඉල්ලුම්පත්‍ර ලැබුණ බව දන්වනු නොලැබේ.

(ii) රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත්‍ර එවිය යුතු ය.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි මෙම තනතුර සඳහා අදළ වේ.

| |
|---|
| අංකය :————. |
| (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා) |

**ආදර්ශ අයදුම්පත්‍රය**

*ණය සහනදයක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන 02 සේවා ගණය ලඝු ලේඛක තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. (*අ*) මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

(*ආ*) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

02. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

04. දුරකථන අංකය :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

06. ස්ත්‍රී/ පුරුෂභාවය :————.

07. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.

08. ඉල්ලුම්පත් භාර ගන්නා දිනට වයස: අවුරුදු :————. මාස :————. දින :————.

09. ජාතිය :————.

10. විවාහක / අවිවාහක :————.

11. අ. පො. ස. (උ/පෙළ) විභාග ප්‍රතිඵල :

විභාග අංකය :————. විභාගයට පෙනී සිටි වර්ෂය :————.

විෂයය :…………… සමාර්ථය :……………
විෂයය :…………… සමාර්ථය :……………
විෂයය :…………… සමාර්ථය :……………

12. අ. පො. ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල :

විභාග අංකය :————. විභාගයට පෙනී සිටි වර්ෂය :————.

සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව සඳහා සමාර්ථය :……………
ගණිතය සඳහා සමාර්ථය :……………

විෂයය :…………… සමාර්ථය :…………… විෂයය :…………… සමාර්ථය :……………
විෂයය :…………… සමාර්ථය :…………… විෂයය :…………… සමාර්ථය :……………
විෂයය :…………… සමාර්ථය :…………… විෂයය :…………… සමාර්ථය :……………

13. භාෂා ප්‍රවීනතාව : (අදාළ තීරුවේ ✓ ලකුණ යොදන්න)

| | ඉතා හොඳයි | හොඳයි | සාමාන්‍යයි | දුර්වලයි |
|---|---|---|---|---|
| සිංහල | | | | |
| දෙමළ | | | | |
| ඉංග්‍රීසි | | | | |

*අයදුම්කරුගේ සහතිකය* :

………………වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත් තනතුරු අතහැර ගිය අයෙකු සේ සලකා නැති බවත් සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙළිවුවහොත් නුසුදුසු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා රැකියාවෙන් ඉවත් කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ……………………………………… මයා/මිය/මෙනවිය ……………………………………… දින සිට අධිකරණයේ/ කම්කරු විනිශ්චය සභාවේ/ ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ ……………………………………… වශයෙන් ස්ථිර/ තාවකාලික/ අනියම් නිලධාරියෙකු/ නිලධාරිනියක වශයෙන් සේවය කරන බවත්, ඔහු/ ඇය විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, අදාළ *ගැසට් නිවේදනය* ප්‍රකාරව ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ ඇය සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත් දන්වමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.
නම :————.
තනතුර :————.
අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :————.

07-1221

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## නීතිපති දෙපාර්තමේන්තුව

### ලඝු ලේඛක III පන්තියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

නීතිපති දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(*අ*) ලඝුලේඛක III වන පන්තියේ සිංහල මාධ්‍ය තනතුරු - 14
(*ආ*) ලඝුලේඛක III වන පන්තියේ ඉංග්‍රීසි මාධ්‍ය තනතුරු - 11
(*ඇ*) ලඝුලේඛක III වන පන්තියේ දෙමළ මාධ්‍ය තනතුරු - 02

02. *අයදුම්පත් භාර ගැනීම.*—මෙම *ගැසට් නිවේදනයේ* අවසානයේ ඇති ආදර්ශ ආකෘතියට අනුව 'ඒ4' ප්‍රමාණයේ (සෙ. මී. 21 x 29) කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අපේක්ෂකයා විසින් අයදුම්පත් සකස්කර ගත යුතු ය. අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 3.0 තෙක් පළමුවන පිටුවට ද 4.0 සිට 8.0 තෙක් දෙවන පිටුවට ද ඉතිරිය තුන්වන පිටුවට ද වන ලෙස පිළියෙළ කර, ඊට අදාළ තොරතුරු තම අත්අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කල යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ලග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද ආදර්ශ අයදුම්පත්‍රය පිළියෙල කිරීමේ දී අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යාවශ්‍යය වේ. අපේක්ෂකයා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ම සම්පූර්ණ කරන ලද අයදුම්පත, 2016.08.25 වැනි දින හෝ ඊට පෙර ලැබෙනසේ "නීතිපති, නීතිපති දෙපාර්තමේන්තුව, තැ. පෙ. 502 කොළඹ 12" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

(අ) අයදුම්පත් එවීමේදී "ලඝු ලේඛක තනතුරු සඳහා බඳවා ගැනීම 2016" යනුවෙන් අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ සඳහන් කළ යුතු ය.

(ආ) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් නියමිත දිනට පෙර එවිය යුතු ය.

(ඇ) අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්පත් හෝ ඊට සම්බන්ධ වෙනත් ලියවිල්ලක්, තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කරන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

(ඈ) අදාළ ආකෘතියට අනුකූල නොවන, අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. *අනන්‍යතාවය.*—තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛණයක් පිළිගනු ඇත.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

04. *සාවද්‍ය තොරතුරු.*—අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිළිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව අනාවරණය වුවහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කරනු ඇත.

05. *මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය.*—රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (iv) අනුව, MN1-2006(ඒ) රු. 13,120-10x145-11x170-10x240-10x320- රු.22,040 වන අතර, වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන අනුවය. තනතුරට පත්වීමෙන් පසු හතර වන වැටුප් පියවර එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. (මෙම වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව සංශෝධනයට යටත් වේ.)

06. *විභාග ගාස්තු.*—මෙම විභාගය සඳහා ගාස්තු රු. 500 කි. එම විභාග ගාස්තුව "නීතිපති" නමින් ලංකා බැංකුව වැප්‍රොබේන් ශාඛාවේ අංක 0007041486 දරන ගිණුමට බැර කර ඒ සඳහා ලබාගත් කුවිතාන්සිය අයදුම්පත්‍රයේ නිසි කොටුවේ අලවා (නිකුත් කල බැංකු ශාඛාව, අංකය හා දිනය සඳහන් කර) තිබිය යුතු ය. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ලග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

07. *වයස් සීමාව :* අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

08. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය. පත් කිරීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

2009.02.20 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද අංක 1589/30 දරන කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

(ii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු තෝරා ගනු ලැබුහොත්, ඔහු/ඇය එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්කරනු ලැබේ.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය නියමිත කාලය තුළ ලබා ගත යුතු ය.

(iv) කොළඹ 12, නීතිපති දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතු ය.

09. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

(i) *අධ්‍යාපන සුදුසුකම් :*

(*අ*) අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ගණිතය සහ සිංහල/ඉංග්‍රීසි/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 04කට අවම වශයෙන් සම්මාන සහිතව එක් වරකදී විෂයයන් 06ක් සමත්ව තිබීම;

සහ

(*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (නව විෂය නිර්දේශය යටතේ සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) අවම වශයෙන් එක් විෂයයකින් හෝ සමත්ව තිබීම.

(ii) *වෘත්තීය සුදුසුකම්* :

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා යතුරු ලියනය හා ලඝුලේඛනය පිළිබඳ මාස හයකට (06) නොඅඩු පාඨමාලාවක්, අයදුම් කරනු ලබන තනතුරට අදාළ භාෂා මාධ්‍යයෙන්ම හදාරා තිබීම ;

(iii) *පළපුරුද්ද* :

(*අ*) අධිකරණයක/කම්කරු විනිශ්චය සභාවක මාස හයකට (06) නොඅඩු කාලයක් අනියම්, කොන්ත්‍රාත් හෝ පුහුණු ලඝුලේඛක ලෙස කටයුතු කර තිබීම.

හෝ

(*ආ*) රජය විසින් පිළිගත් ආයතනයකින් මාස හයකට (06) නොඅඩු කාලයක් ප්‍රායෝගික පුහුණුවක් ලබා තිබීම.

10. අයදුම්කරුවන් විසින් මෙහි පහත දැක්වෙන ලියකියවිලිවල මුල් පිටපත් අවශ්‍ය අවස්ථාවක දී ඉදිරිපත් කිරීම සඳහා සූදානම් කර තබාගත යුතු ය.

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික,
(iii) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්.

11. *පත්වීම සඳහා තෝරාගනු ලබන අන්දම.*—මෙම බඳවා ගැනීමේ විවෘත තරග විභාගය ලිඛිත පරීක්ෂණයකින් හා වෘත්තීය පරීක්ෂණයකින් සමන්විතය. පළමුව ලිඛිත පරීක්ෂණය පැවැත්වෙන අතර සමත්වීම සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකටම ලකුණු සියයට හතලිහක් (40%) හෝ ඊට වැඩියෙන් ලබා ගත යුතු ය. සමත් අයදුම්කරුවන් අතුරින් ඉහළම ලකුණු ලබාගත් අනුපිළිවෙළට, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ. වෘත්තීය පරීක්ෂණයෙන් ද ලකුණු සියයට හතලිහක් (40%) හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින්, ඔවුන්ගේ මුළු ලකුණුවල එකතුවට අනුව කුසලතා පදනම මත තෝරාගනු ලැබේ. (මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සියල්ලම සපුරා තිබීම අනිවාර්ය වේ.)

(i) අයදුම්කරුවන් තනතුරු සඳහා අයදුම් කරන භාෂා මාධ්‍යයෙන්ම විභාගයට පෙනී සිටිය යුතු ය. (*උදා* : ඉංග්‍රීසි මාධ්‍ය තනතුරු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන්ම විභාග යට පෙනී සිටිය යුතු ය.) ඉල්ලුම් කරනු ලබන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) සිංහල මාධ්‍ය අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාව අනුව සිංහල මාධ්‍ය තනතුරු සඳහා ද, ඉංග්‍රීසි මාධ්‍ය අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාව අනුව ඉංග්‍රීසි මාධ්‍ය තනතුරු සඳහා ද, දෙමළ මාධ්‍ය අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාව අනුව දෙමළ මාධ්‍ය තනතුරු සඳහා ද පත් කිරීම සිදු කරනු ලැබේ.

(iii) මෙම විභාගය 2016 ඔක්තෝබර් මස කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

12. *තෝරා ගැනීමේ ක්‍රමය* :

12.1 ලිඛිත විභාගය

| | ප්‍රශ්න පත්‍රය | ලකුණු | කාලය |
|---|---|---|---|
| (i) | බුද්ධි පරීක්ෂණය | 100 | පැය 02 |
| (ii) | සාමාන්‍ය දැනීම | 100 | පැය 02 |

(i) බුද්ධි පරීක්ෂණය :

පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයින් දක්වන නිගමන, ප්‍රතිචාර ආශ්‍රයෙන්, එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණිකරණය, කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහි ලා අපේක්ෂයෙකු සතු සාමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(ii) සාමාන්‍ය දැනීම :

ජාතික, කලාපීය හා සමස්ථ ලෝකයේ විවිධ සංවිධාන පරිසරය තුළ මෙන්ම අප සමාජය තුළ පවත්නා සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාළ වෙනත් සාධකයන් සම්බන්ධයෙන් ද අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ භාවිතය, නිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය, භාෂාවේ යෙදුම් පිළිබඳ අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

12.2 වෘත්තීය පරීක්ෂණය :

| | ප්‍රශ්න පත්‍රය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| (i) | සිංහල/දෙමළ ලඝු ලේඛනය | 100 | 40 |
| (ii) | ඉංග්‍රීසි ලඝු ලේඛනය | 100 | 40 |

(i) සිංහල/දෙමළ ලඝු ලේඛනය :

(*අ*) විනාඩි පහක් (05) තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් විනාඩියකට වචන 70ක වේගයෙන් ලඝු සටහන් කර, එම සටහන විනාඩියකට වචන 08ක වේගයෙන් යතුරු ලියනය කිරීම;

සහ

(*ආ*) විනාඩියකට වචන 30 ක අවම වේගයෙන් විනාඩි 20 ක් යතුරු ලිවීම.

(ii) ඉංග්‍රීසි ලඝු ලේඛනය :

(*අ*) විනාඩි පහක් (05) තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් විනාඩියකට වචන 80ක වේගයෙන් ලඝු සටහන් කර, එම සටහන විනාඩියකට වචන 08ක වේගයෙන් යතුරු ලියනය කිරීම;

සහ

(*ආ*) විනාඩියකට වචන 40ක අවම වේගයෙන් විනාඩි 20ක් යතුරු ලිවීම.

13. විභාගයට පෙනී සිටීම.—විභාගය පැවැත්වන දිනට සතියකට කලින් ලැබෙන සේ විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍රයක්

නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් විභාග ශාලාධිපති වෙත ඔවුනගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම්, ඒ බව නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද සමග විමසීම වඩාත් ඵලදායී වනු ඇත.

14. විභාග අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, සන්නද්ධ හමුදාවන්හි අධිකාරලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට් කළ* තනතුරක් දරන නිලධාරියෙකු හෝ වාර්ෂික වැටුප රු. 292,080 ක් හෝ ඊට වැඩි රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

15. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන සියලුම නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝණය කළහොත් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවේ.

16. මෙම විභාගය පැවැත්වීම, පත්වීම් ලබාදීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය නීතිපති සතු වන්නේ ය.

**සටහන.**—මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළවී ඇති නිවේදන අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල මාධ්‍ය බලපැවැත්විය යුතු බව කරුණාවෙන් සලකන්න.

ජයන්ත ජයසූරිය,
ජනාධිපති නීතීඥ
නීතිපති.

2016 ජූලි මස 12 වැනි දින,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

ආදර්ශ අයදුම්පත්‍රය

නීතිපති දෙපාර්තමේන්තුවේ ලඝු ලේඛක *III* පන්තියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

*The Open Competitive Examination for the Recruitment to the Post of Stenographer (Grade III) in the Attorney General's Department - 2016*

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (උදා : PERERA A. B. C.)

1.2 සම්පූර්ණ නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :—————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

1.5 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) පුරුෂ 0

2.0 2.1 ස්ථිර ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :—————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :
(i) සිංහලෙන්/දෙමළෙන් :—————.
(ii) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :—————.

2.4 දුරකථන අංකය :—————.

3.0 3.1 විවාහක/අවිවාහක බව : විවාහක - 2 අවිවාහක - 1

අදාළ කොටුව තුළ ලියන්න.

3.2 උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

3.3 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස :

අවුරුදු : මාස : දින :

3.4 ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන්ද? :—————.

4.0 *අධ්‍යාපන සුදුසුකම්* :
4.1 අ. පො. ස. (සා. පෙළ) විභාගය :
(i) විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය :—————.
මාසය :—————.
(ii) විභාග අංකය :—————.
(iii) ප්‍රතිඵල :—————.

| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

4.2 අ. පො. ස. (උ. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය :—————. මාසය :—————.
(ii) විභාග අංකය :—————.

(iii) ප්‍රතිඵල :————.

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

5.0 වෘත්තීය සුදුසුකම් :

| පාඨමාලාවේ නම | කාල සීමාව | ආයතනය |
|---|---|---|
| | | |

6.0 පළපුරුද්ද :

| පුහුණුව ලැබූ හෝ සේවය කළ ආයතනයේ නම | කාල සීමාව |
|---|---|
| | |

7.0 ඔබ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකට දඬුවම් ලැබ තිබේද? (අදාළ කොටුවේ ( ✓ ) ලකුණ යොදන්න)

| ඔව් | | නැත | |
|---|---|---|---|

එසේ දඬුවම් ලැබ ඇත්නම්, ඒ කුමන වරදක් සඳහා කවර අධිකරණයකින් කවර දඬුවමක් ලැබ ඇත් ද යන තොරතුරු සපයන්න. :————.

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ ලංකා බැංකු ශාඛාවේ නම :————.
(ii) කුවිතාන්සි අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

9.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් තොරතුරක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් විය හැකි අලාභය විඳ දරා ගැනීමට මම එකඟ වෙමි. තව ද, මෙහි සියලුම තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට අනුකූලව ක්‍රියා කිරීමටත් මෙම කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයක් පිළිගැනීමට මම එකඟ වෙමි.

(ඇ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශනය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්වීම ලැබීමට නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු වුව ද සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................... මයා/මිය/මෙනෙවිය, මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ........... වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

11.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :
(දැනට රාජ්‍ය සේවයේ නියුතු වුවන්ට පමණක් අදාළ වේ.)

...................... මයා/මිය/මෙනෙවිය ........... සේවයේ නියුතු ........... තනතුර දරන නිලධාරියෙකු බවත්, ඔහු/ඇය ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත්, ........... සේවයෙන් ඔහු/ඇය මුදාහැරිය හැකි/නොහැකි බවත් වැඩි දුරටත් දන්වා සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව.

දිනය :————.

07-1136

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### ඉස්ලාම් ආගමික අහදිය්යා අල් කුර්ආන් පාසල් සඳහා වූ අවසන් සහතික පත්‍ර විභාගය - 2015 (2016)

(බෞද්ධ දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය හා සමාන විභාගයකි)

නීතිරීති හා ව්‍යවස්ථා :

1. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ඉහත සඳහන් විභාගය, 2016 නොවැම්බර් මාසය තුළ පැවැත්වීමට කටයුතු යොදා ඇත. එම විභාගය සඳහා වූ විෂය නිර්දේශ, ඇමුණුම 01 හි සඳහන් වේ.

2. විභාග මධ්‍යස්ථාන :

එක් එක් දිස්ත්‍රික්කයෙන් පෙනී සිටීමට නියමිත අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව ඇමුණුම 02හි සඳහන් නගරවල විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලැබේ.

එහෙත් යම්කිසි විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථාන අවලංගු කර එම අයදුම්කරුවන් ඊට ආසන්න වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ.

3. භාෂා මාධ්‍යය :
මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

4. සුදුසුකම් :
මෙම විභාගය සඳහා අයදුම් කරන සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ සම්පූර්ණ කර තිබිය යුතු ය. :-

4.1 මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද අහදිය්යා දහම් පාසලක 10 වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන අයෙකු වීම;

හෝ

4.2 මුස්ලිම් ආගමික හෝ සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද අල්කුර් ආන් මද්රසා විෂය නිර්දේශය සම්පූර්ණ කරන ලද අයෙකු වීම;

හෝ

4.3 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අ. පො. ස. (සා. පෙළ) විභාගයේ ඉස්ලාම් සහ අරාබි විෂයයන්ගෙන් සාමාර්ථ්‍යය ලත් අයෙකු වීම.

*සටහන* :

1. මෙම විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු ම ඉහත 4 වැනි ඡේදයේ සඳහන් කර ඇති සුදුසුකම් ලබා ඇති බවට අහදිය්යා දහම් පාසලේ විදුහල්පති හෝ අල්කුර් ආන් මද්රසාවේ ජ්‍යෙෂ්ඨ විදුහල්පති හෝ පාසලේ විදුහල්පති හෝ සහතික කළ යුතු වේ.

2. සෑම අයදුම්කරුවකු ම මෙම විභාගයට ලියාපදිංචි කළ අහදිය්යා පාසල හෝ ජ්‍යෙෂ්ඨ අල් කුර්ආන් මද්රසාවේ හෝ පාසලේ විදුහල්පති හෝ මගින් පමණක් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

5. ලියාපදිංචි කළ සියලු ම අහදිය්යා දහම් පාසල්, මද්රසා පාසල් වෙත ඉල්ලුම්පත් හා උපදෙස් පත්‍රිකා තැපැල් මගින් යවා ඇති අතර, එසේ නොලැබුණු ආයතන වෙතොත් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට අයදුම්කරුවන් සංඛ්‍යාව සඳහන් කළ ලිපියක් 2016 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එවීමෙන් අයදුම්පත්‍ර හා උපදෙස් පත්‍රිකා ලබාගත හැකිය.

5.1 සියලුම ඉල්ලුම්පත් පිටපත් දෙකකින් යුතුව සකස් කර මුල් පිටපත විභාග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු අතර, අනෙක් පිටපත අදාළ ආයතනයේ ගොනුකර තැබිය යුතු ය.

5.2 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය 2016 අගෝස්තු මස 26 වැනි දින වේ.

5.3 ඉල්ලුම්පත් පැහැදිලිව හා නිවැරදිව සම්පූර්ණ කළ යුතු වේ. එසේ නොවන ඉල්ලුම්පත් හා අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතු වේ. :-

විභාග කොමසාරිස් ජනරාල්,
(සංවිධාන හා විදේශ විභාග ශාඛාව),
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503,
කොළඹ.

5.5 ඉල්ලුම්පත් ලැබුණු බව දැනුම් දෙනු නොලැබේ.

5.6 ඉල්ලුම්පත් බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ ''ඉස්ලාම් ආගමික අහදිය්යා අවසාන සහතික පත්‍ර විභාගය - 2015 (2016)'' යනුවෙන් හා ඉල්ලුම් කරන නගරය ද සඳහන් කළ යුතුය.

5.7 ඉල්ලුම්පත්‍ර සමග කිසිදු සහතිකයක් අමුණා එවිය යුතු නැත. අහදිය්යා දහම් පාසලේ හෝ මද්රසාවේ විදුහල්පති හෝ පාසලේ විදුහල්පති හෝ

ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය නියමිත සුදුසුකම් ලබා ඇති බව සහතික කළ යුතු ය.

6. විභාග ගාස්තු ගෙවන ආකාරය :

6.1 පළමුවැනි වරට මෙම විභාගයට පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අයකරනු නොලැබේ. පළමුවැනි වරට පසු සම්පූර්ණ විභාගයටම පෙනී සිටින අයදුම්කරුවන් විභාග ගාස්තු වශයෙන් රුපියල් 150 ක් ගෙවිය යුතු ය. ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කිරීම සඳහා වන විෂයයට රුපියල් 50 ක විභාග ගාස්තුවක් ගෙවිය යුතු ය.

6.2 විභාග ගාස්තු ගෙවිය යුතු අයදුම්කරුවන් වෙනුවෙන් ගෙවිය යුතු මුළු මුදලට සමාන ගාස්තුව දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතු ය. (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

7. ප්‍රවේශ පත්‍ර :

විභාග කොමසාරිස් ජනරාල් විසින් අදාළ අහදිය්‍යා විදුහල්පති වෙත හෝ මද්රසා විදුහල්පති වෙත හෝ පාසලේ විදුහල්පති වෙත හෝ විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විදුහල්පති විසින් එම ප්‍රවේශ පත්‍ර අයදුම්කරුවන් වෙත ලබාදිය යුතු වේ.

7.1 යම්කිසි විභාග අයදුම්කරුවෙකු විභාගයට පෙනී සිටින පළමුවැනි දිනයේ තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද විභාග මධ්‍යස්ථානය හැර වෙනත් මධ්‍යස්ථානයක විභාගයට පෙනී සිටීමට තැත් කළහොත් අදාළ අයදුම්කරුගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

7.2 ප්‍රවේශ පත්‍රයේ ඇති ඉල්ලුම්කරුගේ අත්සන අහදිය්‍යා දහම් පාසලේ විදුහල්පති හෝ මද්රසා විදුහල්පති හෝ අරාබි විදුහලේ විදුහල්පති හෝ රජයේ සේවයේ යෙදී සිටින රුපියල් 2,40,360 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර රජයේ නිලධාරියකු හෝ මස්ජිද් භාර ඉමාම් යන අයගෙන් කෙනකු හෝ විසින් සහතික කළ යුතු ය.

7.3 විභාගය පැවැත්වීමට සතියකටවත් පෙර ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ අහදිය්‍යා පාසල්වල හෝ මද්රසා පාසල්වල විදුහල්පතිවරු මේ පිළිබඳව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දිය යුතු ය. එවැනි සෑම අවස්ථාවක දී ම පහත සඳහන් කරුණු දැනුම් දිය යුතු ය :-

(අ) විභාගයේ නම ;
(ආ) අහදිය්‍යා පාසල්/කුර්ආන් මද්රාසා/රජයේ පාසලේ නම හා පරිගණක අංකය ;
(ඇ) අයදුම්කරුගේ සම්පූර්ණ නම හා ලිපිනය ;
(ඈ) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ නගරය ;
(ඉ) ඉල්ලුම් පත්‍රය භාරදුන් තැපැල් කාර්යාලය ;
(ඊ) ලියාපදිංචි කළ දිනය හා අංකය ;

8. අනන්‍යතාව .— එක් එක් විෂයයට පෙනී සිටින සෑම අවස්ථාවකම විභාග ශාලාධිපතිට පිළිගත හැකි වන පරිදි අපේක්ෂකයින් විසින් තමන්ගේ අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා සූදානම්ව පැමිණිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ.

8.1 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
8.2 වලංගු විදෙස් ගමන් බලපත්‍රය,
8.3 තැපැල් හැඳුනුම්පත.

9. විභාග ප්‍රතිඵල නිකුත් කිරීම හා සමත් බව සහතික කිරීම :

9.1 මෙම විභාගය සඳහා නියමිත විෂයයන් ගණන හතරක් වන අතර, විභාගයෙන් සාමාර්ථ්‍යය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකු ම එම විෂයයන් හතරෙන් ම සමත් විය යුතු ය.

9.2 එක් වතාවක දී අදාළ විෂය හතරෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් ඌන සාමාර්ථ්‍යයක් ලෙස සලකනු ලැබේ. විභාගයට පෙනී සිටි වර්ෂයේ සිට අනුගාමී වසර දෙකක් (02) ඇතුළත එම ඌන සාමාර්ථ්‍යය ලැබූ විෂයයට පමණක් නැවත පෙනී සිට, එය සමත් වී, ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කළ යුතුය. (මෙය 2011 වසරට අදාළ විභාගයේ සිට බලපැවැත් වේ.)

9.3 එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු සියයක් (100) හිමි වේ. මෙහි දී ලබාදෙන එක් එක් ශ්‍රේණි සඳහා අදාළ ලකුණු පරාස පහත පරිදි වේ. :—

| ලකුණු පරාසය | ශ්‍රේණිය | සංකේතය |
|---|---|---|
| 0-34 | අසමත් | F |
| 35-54 | සමත් | S |
| 55-69 | සම්මාන | C |
| 70-100 | විශිෂ්ට සම්මාන | D |

9.4 විභාග ප්‍රතිඵල නිකුත් කිරීම :

විභාග ප්‍රතිඵල පිළිබඳ විස්තර අදාළ ආයතන ප්‍රධානීන් වෙත තැපැල් මගින් දන්වා යවනු ලැබේ.

10. සහතික පත්‍ර :

විභාගයෙන් සාමාර්ථ්‍යය ලබන සියලුම අයදුම්කරුවන්ට සහතික පත්‍ර නිකුත් කරනු ලැබේ.

11. ප්‍රතිඵල නැවත සමීක්ෂණය :

විභාග ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකි ය. විභාග

දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයක් මගින්, නියමිත ගාස්තු ගෙවා අදාළ ආයතනයේ විදුහල්පති මගින් ඒ සඳහා ඉල්ලුම් කළ යුතු ය. විභාග ප්‍රතිඵලවල වෙනසක් සිදුවුවහොත් පමණක් ගාස්තු ආපසු ගෙවනු ලැබේ. කවර හෝ හේතුවක් මත ඉල්ලුම්කරුට හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයකුට හෝ උත්තරපත්‍ර නිරීක්ෂණයට අවසර දෙනු නොලැබේ.

12. ඉහත සඳහන් කොන්දේසි හා උපදෙස්වලට අනුකූලව කටයුතු කිරීමට සියලු ම අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි සඳහන් නොවූ කරුණු සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි තීරණ ගනු ලැබේ.

13. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම් එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කළ යුතු ය.

ඩබ්ලිව්. එම්. එන්. ජේ. පුෂ්පකුමාර,
විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

ඇමුණුම - 01

**විභාගය සඳහා වූ විෂයයන් හා විෂය නිර්දේශය**

මෙම විභාගයට අයත් එක් එක් ප්‍රශ්න පත්‍රයක් පැය තුනක කාලයක් සඳහා සකස් කර ඇති අතර, එවැනි ප්‍රශ්න පත්‍ර හතරක් විභාගයට අයත් වේ. ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සහ ප්‍රශ්නයන්ට ලකුණු වෙන් කරන ආකාරය අංක 1358 හා 2004.09.10 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනයේ* සඳහන් පරිදිම සිදු කෙරේ.

***පළමුවැනි ප්‍රශ්න පත්‍රය*** :

1. අකීදා සහ ෂරිආ (ඉස්ලාම් සිද්ධාන්ත හා මූලිකාංග) සහ ආරාබි භාෂාව :

1.1 අකීදා පොදු පැහැදිලි කිරීම් (අල් ඉලාහියියාත්, අන්නුබුව්වත්, අර්රූහානීයත්, අස්සම් ඉය්යාත්)

1.2 අකීදාවේ කොටස් :
+ අහුලුස්සුන්නා වල්ජමා අත්හි අකීදා
+ අනිකුත් අකීදා කොටස් කිහිපයක් : ජබරිය්යා, කදිරිය්යා, මුර්ජියා, මුඃතසිලා, ෂියා

1.3 තෞහිද් හා ෂිර්ක්කු :
+ ඊමාන් හා කුෆ්රු
+ රිද්දත්, නිෆාක්
+ අල්කුර්ආණය පහළ කර එය සම්පාදනය කරන ලද ආකාරය පිළිබඳ ඉතිහාසය
+ නීති මූලධර්මයන් වශයෙන් අල්කුරාණයේ උපයෝජනය
+ සුන්නාවේ බිහිවීම හා එය සම්පාදනය කළ ඉතිහාසය
+ නෛතික මූලධර්ම වශයෙන් සුන්නාවේ උපයෝජනය
+ හදීස් කලා ඉතිහාසය හා ප්‍රධාන මුහද්දීස්වරුන්ගේ දායකත්වය
+ ඉජ්තිහාද් පිළිබඳ විස්තර
+ ආධාරක මූලධර්මයන් වශයෙන් ඉජ්මා
+ ආධාරක මූලධර්මයන් වශයෙන් කියාස්
+ ෆික්හයේ ඉතිහාසය හා ප්‍රධාන ඉමාම්වරු

1.4 අරාබි භාෂාව :
+ හැඩහුරු සහිතව ලිවීම
+ කුඩා වාක්‍යයන් ලිවීම
+ ඉස්ලාම් විෂයයට අදාළ අරාබි වචන ලිවීම
+ ප්‍රධාන සූරා, ආයත්, හදීස් ආදිය නිවැරදිව ලිවීම

***දෙවැනි ප්‍රශ්න පත්‍රය*** :

2. අල්ෆික්හුල් ඉස්ලාම් (ඉස්ලාමීය නීති පද්ධතිය)

2.1 ඉබාදත් පිළිබඳ විස්තර :
+ ඉබාදතයේ කොටස්
+ තහාරත්

2.2 නජීසය හා එහි කොටස් :
+නජීසය පිරිසිදු කිරීමේ ක්‍රම
+ජලය හා එහි වර්ග
+වුලු, තයම්මුම්, ස්නානය පිළිබඳ පවතින ක්‍රියාදාමයන්

2.3 සකාත් :
+ වැදගත්කම
+ විධි හා ක්‍රම
+ එක්රැස් කිරීම හා බෙදා හැරීම
+ සකාත් මගින් දිළිඳුකම තුරන් කිරීම සහ සම්පත් බෙදීම

2.4 නෝම්බිය (උපවාසය) :
+ වැදගත්කම
+ විධි ක්‍රම හා ප්‍රයෝජන

2.5 හජ් :
+ වැදගත්කම
+ විධි ක්‍රම හා ප්‍රයෝජන

2.6 හජ් ඉටු කරන ක්‍රමය :
+ පරලු වාජිබ් සුන්නත්
+ පරලු හජ් යට අමතරව ඉටුකරන හජ්

2.7 ඉස්ලාම්හි ආහාර, ඇඳුම්, වාසස්ථාන පිළිබඳ අවධානය හා ක්‍රියාදාමයන්

2.8 ජිහාත් පිළිබඳ පැහැදිලි කිරීම

2.9 කුර්බානි හා කැපුම් ක්‍රමයන්

2.10 දිව්රුම හා භාරවීම

2.11 මුආමලාත් පිළිබඳ විස්තර :
+ ඉපයීමේ වැදගත්කම
+ ප්‍රධාන ගණුදෙනු (වෙළඳාම)
+ අනිකුත් ගණුදෙනු (*උදා.* : තාවකාලිකව ඉල්ලා ගැනීම, බදු ගැනීම)
+ වක්ෆු, වසීය්යත්, වරාසත්, (පොදු දේපළ, බූදල් දේපළ, පරම්පරා දේපළ)

2.12 ඉස්ලාම්හි ස්ත්‍රී පුරුෂ තත්ත්වයන් :
+ නිකාහයේ විධි හා ප්‍රයෝජන
+ පවුල් ජීවිතය
+ අඹුසැමියන්
+ දෙමාපිය, දූදරු අයිතිවාසිකම් හා යුතුකම්
+ තලාක් හා ඉද්දා

2.13 ජිනායත් :
+ හුදූද්, කියාස්, තඃසීර්

*තුන්වන ප්‍රශ්න පත්‍රය* :

3. සීරා හා තාරිකු :

3.1 ඉස්ලාමයට පෙර වූ අරාබි රටේ සමාජ ආගමික තත්ත්වයන්
3.1.1 නබි(සල්) තුමා
+ නුබුව්වතයට පෙර ජීවිතය
● පවුල, පරම්පරාව
● තරුණ විය
● උතුම් ගුණාංග
● විවාහය

+ නුබුව්වත් හා හිජ්රත් අතර ජීවිතය
● නුබුව්වත් ලැබීම
● ඉස්ලාමික ප්‍රචාරයන් හා එහි ප්‍රතිඵල
● මිඃරාජ්
● හිජ්රත්

+ මදීනා ජීවිතය
● සමාජ දේශපාලන ක්‍රියාකාරකම්
● ආත්මාරක්ෂා යුද්ධයන් හා සාම ගිවිසුම්
● ඉස්ලාම් සම්පූර්ණවීම
● සහාබාවරුන්ගේ තත්ත්වයන් හා ඉස්ලාමය වෙනුවෙන් එතුමන්ලාගේ දායකත්වයන්
● කුලපාඋර්රා සීදුන් යන අයගේ ඉතිහාසය හා දේශපාලන දායකත්වයන්
● උමය්යා අබ්බාසිය්යා පාලනකාලය
● බයිතුල් මුකද්දසයේ ඉතිහාසය
● ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා දායකත්වය
● විද්‍යාත්මක දැනුමට මුස්ලිම්වරුන්ගේ දායකත්වය
● පහත සඳහන් අය පිළිබඳ ඉතිහාසය :-
  * ඉමාම් බුහාරි (රහ්)
  * ඉමාම් ෂාපිර් (රහ්)
  * ඉමාම් ගස්සාලි (රහ්)
  * ඉමාම් අබ්දුල් කාදර් ජිලාන් (රහ්)
  * ඉමාම් ෂාදුලි (රහ්)

*හතරවන ප්‍රශ්න පත්‍රය* :

4. අක්ලාක් - (ඉස්ලාම් සාරධර්මය)

4.1 අක්ලාක් පිළිබඳ ඉස්ලාමයේ අවධානය :
+ අක්ලාක් පිළිබඳ විස්තර
+ ඊමාන් සහ අක්ලාක් අතර පවතින සම්බන්ධතාවය
+ අක්ලාක් හා ඉබාදත් අතර තිබෙන සම්බන්ධතාවය
+ හෘද පවිත්‍රත්වය (ඉක්ලාස්)

4.2 තක්වා :
+ වරඋසුහ්ද්
+ මුරාකබා, මුහාසබා
+ ෂවුක් (දේවකරුණාව)

4.3 දන්දීම :
+ කැපවීම
+ කෘතඥභාවය
+ ඉවසීම, හික්මීම, ඉඩදීම, සමාවීම
+ බැගෑපත්වීම
+ කාලය අගය කිරීම
+ අවයවයන් රැකගැනීම කට, ඇස, කණ, ලිංගික අංගයන්
+ අන් අයට ගෞරව කිරීම
+ යුක්තිය හා අවංකභාවය
+ තරුණ තරුණියන් අතර දක්නට ලැබිය යුතු වැදගත් සදාචාර ගුණාංගයන්
+ අනිකුත් ආගමික අය අතර වූ සහජීවනය

4.4 ඉස්ලාම් නීති පද්ධතිය :

ඇමුණුම 02

අදාළ දිස්ත්‍රික්කවල විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට
බලාපොරොත්තුවන නගර හා නගර අංක

| නගරය | නගර අංකය | දිස්ත්‍රික් අංකය |
|---|---|---|
| *කොළඹ දිස්ත්‍රික්කය* : | | 01 |
| මැද කොළඹ | 01 | |
| බම්බලපිටිය | 02 | |
| *ගම්පහ දිස්ත්‍රික්කය* : | | 02 |
| තිහාරිය | 03 | |
| මාබෝල | 04 | |
| මල්වාන | 05 | |
| මීගමුව | 06 | |
| කල්එළිය | 07 | |

| *නගරය* | *නගර අංකය* | *දිස්ත්‍රික් අංකය* |
|---|---|---|
| **කළුතර දිස්ත්‍රික්කය :** | | 03 |
| පානදුර | 08 | |
| කළුතර | 09 | |
| අලුත්ගම | 10 | |
| **ගාල්ල දිස්ත්‍රික්කය :** | | 04 |
| ගාල්ල | 11 | |
| **මාතර දිස්ත්‍රික්කය :** | | 05 |
| වැලිගම | 12 | |
| මාතර | 13 | |
| **හම්බන්තොට දිස්ත්‍රික්කය :** | | 06 |
| හම්බන්තොට | 14 | |
| **කෑගල්ල දිස්ත්‍රික්කය :** | | 07 |
| මාවනැල්ල | 15 | |
| වරකාපොල | 16 | |
| කන්නත්තොට | 17 | |
| **කුරුණෑගල දිස්ත්‍රික්කය :** | | 08 |
| කුලියාපිටිය | 18 | |
| කුරුණෑගල | 19 | |
| මැල්සිරිපුර | 20 | |
| පොල්ගහවෙල | 21 | |
| කැකුණගොල්ල | 22 | |
| **පුත්තලම දිස්ත්‍රික්කය :** | | 09 |
| නොරොච්චෝලෙයි | 23 | |
| පුත්තලම | 24 | |
| හලාවත | 25 | |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය :** | | 10 |
| අනුරාධපුර | 26 | |
| කැකිරාව | 27 | |
| ගලෙන්බිඳුණුවැව | 28 | |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය :** | | 11 |
| කදුරුවෙල | 29 | |
| **මාතලේ දිස්ත්‍රික්කය :** | | 12 |
| මාතලේ | 30 | |

| *නගරය* | *නගර අංකය* | *දිස්ත්‍රික් අංකය* |
|---|---|---|
| **මහනුවර දිස්ත්‍රික්කය :** | | 13 |
| මහනුවර | 31 | |
| නාවලපිටිය | 32 | |
| දෙල්තොට | 33 | |
| ගෙලිඔය | 34 | |
| **නුවරඑළිය දිස්ත්‍රික්කය :** | | 14 |
| නුවරඑළිය | 35 | |
| **රත්නපුර දිස්ත්‍රික්කය :** | | 15 |
| ඇහැලියගොඩ | 36 | |
| බලංගොඩ | 37 | |
| **බදුල්ල දිස්ත්‍රික්කය :** | | 16 |
| බදුල්ල | 38 | |
| වැලිමඩ | 39 | |
| **මොණරාගල දිස්ත්‍රික්කය :** | | 17 |
| බිබිල | 40 | |
| **අම්පාර දිස්ත්‍රික්කය :** | | 18 |
| අක්කරෙයිපත්තුව | 41 | |
| පොතුවිල් | 42 | |
| කල්මුනේ | 43 | |
| සමන්තුරේ | 44 | |
| ඉරක්කාමම් | 45 | |
| නින්දවූර් | 46 | |
| ඔලුවිල් | 47 | |
| **මඩකලපුව දිස්ත්‍රික්කය :** | | 19 |
| කාත්තාන්කුඩි | 48 | |
| එරාවූර් | 49 | |
| වාලච්චේන | 50 | |
| **ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය :** | | 20 |
| මුතූර් | 51 | |
| කින්නියා | 52 | |
| ත්‍රිකුණාමලය | 53 | |
| **වවුනියාව දිස්ත්‍රික්කය :** | | 21 |
| වවුනියාව | 54 | |

| *නගරය* | *නගර අංකය* | *දිස්ත්‍රික් අංකය* | *නගරය* | *නගර අංකය* | *දිස්ත්‍රික් අංකය* |
|---|---|---|---|---|---|
| **මන්නාරම දිස්ත්‍රික්කය :** | | 22 | **කිලිනොච්චි දිස්ත්‍රික්කය :** | | 24 |
| මන්නාරම | 55 | | කිලිනොච්චි | 57 | |
| **මුලතිවු දිස්ත්‍රික්කය :** | | 23 | **යාපනය දිස්ත්‍රික්කය :** | | 25 |
| මුලතිවු | 56 | | යාපනය | 58 | |

07-1132

---

**නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත**

*ආධුනිකයින් බඳවා ගැනීම - 2017 වසර*

ජපන් - ශ්‍රී ලංකා මිත්‍රත්වය මත ප්‍රධානය වූ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පවත්වනු ලබන පහත සඳහන් පූර්ණ කාලීන පාඨමාලා සඳහා 2017 වර්ෂයට ආධුනිකයින් බඳවා ගැනීම පිණිස වයස අවුරුදු 16 ට නොඅඩු 25 ට නොවැඩි ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *අයදුම්පත් කැඳවනු ලබන පූර්ණ කාලීන පාඨමාලා :*

| *පාඨමාලා* | *කාලය* | *බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| 1.1 මෝටර් රථ කාර්මික ශිල්පී<br>Automobile Mechanic | අවු. 03 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් සිංහල, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවතාවකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. |
| 1.2 මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී<br>Automobile Electrician | අවු. 03 | |
| 1.3 යන්ත්‍ර ශිල්පී<br>Machinist | අවු. 03 | |
| 1.4 මෝටර් රථ වායු සමීකරණ යාන්ත්‍රික ශිල්පී<br>Automobile A/C Mechanic | අවු. 02 | |
| 1.5 මෝටර් රථ වැද්දුම් ශිල්පී<br>Automobile Tinker | අවු. 1 1/2 | රජයේ හෝ රජය විසින් පිළිගන්නා ලද පාසලක 8 වන ශ්‍රේණිය සමත් වී තිබීම. |
| 1.6 මෝටර් රථ පින්තාරු ශිල්පී<br>Automobile Painter | අවු. 1 1/2 | |

2. *වයස :*

2017.01.01 දිනට වයස අවුරුදු 16ට නොඅඩු සහ 25ට නොවැඩි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයටම අයදුම් කළ හැක.

3. පාඨමාලා පුහුණු විස්තර :

3.1 ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව (NVQ) යටතේ වූ නිපුණතා පාදක පුහුණු ක්‍රමය සහ ද්විත්ව පුහුණු ක්‍රමය අනුව සියලුම පාඨමාලා පැවැත්වේ.

3.2 ඒ අනුව 1.1 සිට 1.4 දක්වා වූ පාඨමාලාවල පළමු වසරේ ආයතනික පුහුණුවේ දී ලබාගත් න්‍යායික සහ ප්‍රායෝගික දැනුම සහ කුසලතාවය වර්ධනය කර ගැනීම සඳහා පාඨමාලාවේ දෙවැනි හා තුන්වැනි වසර කර්මාන්ත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හා නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ කර්මාන්ත ශාලාවලට අනුයුක්ත කරනු ලැබේ.

3.3 1.5 සහ 1.6 පාඨමාලා සඳහා පුහුණුවේ පළමු මාස 06 ආයතනය තුළ දී න්‍යායික සහ ප්‍රායෝගික පුහුණුව ලබාදෙන අතර, ඉතිරි වසර කර්මාන්ත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හා නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ කර්මාන්ත ශාලාවලට අනුයුක්ත කරනු ලැබේ.

3.4 1.3 පාඨමාලාවේ ලියවන පට්ටල් සහ සීඑන්සී (CNC) මිලින් යන්ත්‍ර ඇතුලු මූලික යන්ත්‍රවලට අමතරව මෝටර් රථ ඉංජිනේරු /ක්ෂේත්‍රයට අයත් හෙඩ් ෆේසින්, බෝරිං, හෝනින්, ක්‍රෑන්ක් ග්‍රයින්ඩින් සහ ටූල් කටර්, ග්‍රයින්ඩින් යන සියලුම යන්ත්‍රවල පුහුණුව ඇතුළත්ව 3.2 හි සඳහන් පරිදි පුහුණු කෙරේ.

4. පාඨමාලා කාලය තුළ ලබාදෙන ප්‍රතිලාභ :

4.1 සියලුම ආධුනිකයින්ට පුහුණුවේ නිරතවීමට වැඩහල් නිල ඇඳුමක් ලබාදේ.
4.2 තෝරාගනු ලබන ආර්ථික අපහසුතාවයන් ඇති ආධුනිකයින්ට ශිෂ්‍යාධාර ලබාදේ.
4.3 පාඨමාලා කාලය තුළ ඉංග්‍රීසි භාෂාව හා පරිගණක දැනුම ලබා දේ.
4.4 පුස්තකාල පහසුකම්/අධ්‍යාපන චාරිකා.

5. ආධුනිකත්ව ගිවිසුම :

5.1 තෝරාගනු ලබන සෑම ආධුනිකයෙක් විසින්ම මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය සමග ආධුනිකත්ව ගිවිසුමකට එළඹිය යුතු ය. ආයතනයේ විනය නීති රීතිවලට අනුව සතුටුදායක ලෙස පාඨමාලාව අවසන් කිරීමට අපොහොසත් වුවහොත් ආධුනිකත්ව ගිවිසුම අවලංගු කරනු ලැබේ.

6. සහතිකපත් ප්‍රදානය :

6.1 සාර්ථක ලෙස පුහුණුව අවසන් කර ජාතික වෘත්තීය සුදුසුකම් අවසාන ඇගයීම් පරීක්ෂණයෙන් සමත්වන ආධුනිකයින්ට තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ජාත්‍යන්තරව පිළිගත් "ජාතික වෘත්තීය සුදුසුකම් 4 වැනි මට්ටමේ සහතිකය" සමග මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ සහතිකය ද ප්‍රදානය කරනු ලබයි.

7. පාඨමාලා සඳහා තෝරා ගැනීම :
බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් සපුරාලන සියලුම අයදුම්කරුවන් ගණිතය සහ සාමාන්‍ය දැනීම ඇතුළත් පැය 01 ක අභියෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර, ඉන් ලබා ගත් ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවා තෝරා ගැනීම සිදුකරනු ලබයි.

8. අයදුම්පත් එවිය යුතු ආකාරය :
මි. මී. 290 x මි. මී. 210 (A4) ප්‍රමාණයේ කඩදාසියක පහත සඳහන් උපදෙස් හා ආකෘතිය අනුව පිළියෙල කරගත් අයදුම්පත, රු. 40 මුද්දරයක් ඇලවූ සහ ඔබගේ ලිපිනය සඳහන් දිග ලියුම් කවරයක් සමග මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ දෙමටගොඩ මහජන බැංකු ශාඛාවේ ගිණුම් අංක 071100103320674 දරන ගිණුමට විභාග ගාස්තු ලෙස රු. 300 ක් බැර කර ලබාගත් ලදු පතෙහි ඡායා පිටපත එම අයදුම්පතේ පසු පිටෙහි පෙන්වා ඇති ස්ථානයේ අලවා 2016 අගෝස්තු මස 31 දිනට හෝ ඊට ප්‍රථම අධ්‍යක්ෂ/විදුහල්පති, මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 07, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ උඩ වම් කෙලවරේ "ආධුනිකයින් බඳවා ගැනීම - 2017" යනුවෙන් සඳහන් කළ යුතු ය. අප ආයතනයට පැමිණ ද ඉල්ලුම්පත් නොමිලේ ලබාගත හැකිය. නැතහොත් අපගේ www.aeti.edu.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

*අයදුම්පත සම්පූර්ණ කිරීමට උපදෙස් :*

* අයදුම්කරුගේ අභිමතය පරිදි, ප්‍රමුඛතාවය ලබාදෙමින් පාඨමාලා තුනක් අයදුම්පතේ 10 වන ඡේදයේ සඳහන් කර අයදුම් කළ හැකිය.

* ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ දැනට පුහුණුව ලබමින් සිටින අයට අයදුම් කළ නොහැක.

* තැපෑලේ දී අස්ථානගතවන හෝ ප්‍රමාදවන අයදුම්පත්වලට මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය වග නොකියන අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත් කල් ඇතුව එවන මෙන් දන්වා සිටිනු ලැබේ.

* වැඩිදුර තොරතුරු සඳහා ලේඛකාධිකාරී, දුරකථන අංක - 011-2572977 හෝ 011-2532182 විමසන්න.

සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

AETI/AD/AP/02

**නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය

**ආධුනිකයින් බඳවා ගැනීමේ අයදුම්පත - 2017 වර්ෂය**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

01. මුලකුරු සමග නම :

02.

| ස්ත්‍රී | පුරුෂ |
|---|---|
| | |

03. සම්පූර්ණ නම :

| 04. උපන් දිනය | වර්ෂය | මාසය | දිනය |
|---|---|---|---|
| | | | |

05. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

06. ලිපිනය :

දුරකථන අංකය :

07. පරිපාලන දිස්ත්‍රික්කය :

ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාසය :

08. අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති උසස්ම සුදුසුකම් X ලකුණ යොදන්න.)

| 8 වන ශ්‍රේණිය | | අ.පො.ස. (සා. පෙළ) | | අ.පො. ස. (උ. පෙළ.) | |
|---|---|---|---|---|---|

09. අ.පො.ස. (සා. පෙළ.) විභාග ප්‍රතිඵල :

| | *සමත් වූ විෂයයන්* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|---|
| 1. | ........................ | ............ | ............ |
| 2. | ........................ | ............ | ............ |
| 3. | ........................ | ............ | ............ |
| 4. | ........................ | ............ | ............ |
| 5. | ........................ | ............ | ............ |
| 6. | ........................ | ............ | ............ |
| 7. | ........................ | ............ | ............ |

| | *සමත් වූ විෂයයන්* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|---|
| 8. | ........................ | ............ | ............ |
| 9. | ........................ | ............ | ............ |
| 10. | ........................ | ............ | ............ |
| 11. | ........................ | ............ | ............ |
| 12. | ........................ | ............ | ............ |
| 13. | ........................ | ............ | ............ |
| 14. | ........................ | ............ | ............ |

අ.පො.ස. (උ. පෙළ.) විභාග ප්‍රතිඵල ඃ

| සමත්වූ විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|
| 1. ........................ | ............ | ............ |
| 2. ........................ | ............ | ............ |

| සමත් වූ විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|
| 3. ........................ | ............ | ............ |
| 4. ........................ | ............ | ............ |

10. තෝරා ගනු ලබන පාඨමාලාවන් පිළිවෙලින්

| |
|---|
| 1. |
| 2. |
| 3. |

ඉහත සඳහන් කරුණු නිවැරදි බවත්, සත්‍ය බවත් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ දැනට පුහුණුවක් මා නොලබන බවත්, මෙයින් සහතික කරන අතර මෙහි දක්වා ඇති කරුණු අසත්‍ය බවට අනාවරණය වුවහොත්, මම මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පාඨමාලාව හැදෑරීම සඳහා නුසුදුස්සෙකු වන බවත් හොඳාකාරව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

07-1027

---

**ඉඩම් අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයෙහි තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය**

1.0 මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට පැවැත්වෙන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු ඃ

වගුව - අංක 01 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු

| අනු. අංකය | තනතුරු නාමය | | පිරවීමට තිබෙන පුරප්පාඩු ගණන | බඳවා ගන්නා ශ්‍රේණිය |
|---|---|---|---|---|
| 01 | ගොඩනැගිලි පරිපාලක | කොළඹ ප්‍රධාන කාර්යාලයේ පමණක් පවතින තනතුරු වේ. මුළු සේවා කාලය තුළම ප්‍රධාන කාර්යාලයේ සේවය කළ යුතු වේ. | 01 | III ශ්‍රේණිය |
| 02 | ප්‍රවාහන නිලධාරී | | 01 | III ශ්‍රේණිය |

1..2 තනතුරුවල රාජකාරි ස්වභාවය :

වගුව - අංක 02 තනතුරුවල රාජකාරි ස්වභාවය

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *රාජකාරි ස්වභාවය/ප්‍රධාන කාර්යයන්* |
|---|---|---|
| 1. | ගොඩනැගිලි පරිපාලක | ● වාර්ෂික ගොඩනැගිලි නඩත්තු සැලැස්ම සකස් කිරීම<br>● ගොඩනැගිලි නඩත්තු ක්‍රියාවලිය<br>● කළමනාකරණයට යෝජනා කිරීම<br>● සේවක කණ්ඩායම් සුපරීක්ෂාව<br>● නඩත්තුවලට අවශ්‍ය අමුද්‍රව්‍ය, උපකරණ ගබඩා කිරීම හා කළමනාකරණය<br>● ගෙවීම් කටයුතු සඳහා මිනුම් ගැනීම සහ<br>● නිර්දේශ ලබා ගැනීම |
| 2. | ප්‍රවාහන නිලධාරී | ● දෙපාර්තමේන්තුව සතු වාහන ධාවනයට සුදුසු තත්වයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්ෂණික තොරතුරු සපයාදීම.<br>● අළුත්වැඩියාවන්ට අවශ්‍ය නිර්දේශ හා කාර්මික වාර්තා ලබා දීම<br>● අළුත්වැඩියාවලින් පසු වාහනවල ධාවන තත්වය පරීක්ෂා කිරීම, වාහන නඩත්තුව පිළිබඳ පරීක්ෂා කිරීම<br>● රියැදුරන්ට උපදෙස් දීම<br>● රිය අනතුරුවල දී වහා පරීක්ෂා කර බලා වාර්තා ලබාදීම සහ අබලන් වාහන ගර්හිත කිරීම ආදී කටයුතු<br>● පරිසර හිතකාමී සහතික ලබා ගැනීම සඳහා වාහන සැකසීම |

2.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 *වැටුප* :

වගුව - අංක 03

| *ශ්‍රේණිය* | *වැටුප් පරිමාණය* | *ආරම්භක මාසික වැටුප* |
|---|---|---|
| III ශ්‍රේණිය | මාසිකව රු. 31,040 - 10 x 445 - 11 x 660 - - 10 x 730 - 10 x 750 - රු. 57,550 (එම්එන්3 - 2016) | රු. 31,040 (රා. ප. ච.03/2016 අනුව 2017.01.01 දිනට හිමිවිය යුතු වැටුප රු. 21,419) |
| II ශ්‍රේණිය | මාසිකව රු. 31,040 - 10 x 445 - 11 x 660 - - 10 x 730 - 10 x 750 - රු. 57,550 (එම්එන්3 - 2016) (12 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ.) | රු. 36,150 (රා. ප. ච.03/2016 අනුව 2017.01.01 දිනට හිමිවිය යුතු වැටුප රු. 24,951) |
| I ශ්‍රේණිය | මාසිකව රු. 31,040 - 10 x 445 - 11 x 660 - - 10 x 730 - 10 x 750 - රු. 57,550 (එම්එන්3 - 2016) (23 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ.) | රු. 43,480 (රා. ප. ච.03/2016 අනුව 2017.01.01 දිනට හිමිවිය යුතු වැටුප රු. 30,019) |

4.0 මෙම තනතුර ස්ථිර ය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අනුව කටයුතු කරනු ඇත. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, මෙම තනතුරු කොළඹ ප්‍රධාන කාර්යාලයේ පවතින තනතුරු වන බැවින් මුළු සේවා කාලය තුළම ප්‍රධාන කාර්යාලයේ සේවය කළ යුතු ය. මෙම *ගැසට්* නිවේදනයේ ආරම්භයේ ඇති රාජ්‍ය සේවයට පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසිවලට යටත් විය යුතු ය.

5.0 සුදුසුකම් :

5.1 මූලික සුදුසුකම් :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 වන අතර, උපරිම වයස අවුරුදු 30 වේ,

5.2 අධ්‍යාපන සුදුසුකම් :

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම;

සහ

(ආ) සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව යන විෂයයන් දෙක (02) සහිතව විද්‍යා විෂයයන් තුනකින් (03) අ. පො. ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්ව තිබීම.

5.3 වෘත්තීය සුදුසුකම් :

ප්‍රවාහන නිලධාරි තනතුර සඳහා යාන්ත්‍රික ක්ෂේත්‍රයෙන් ද ගොඩනැගිලි පරිපාලක තනතුර සඳහා සිවිල් ක්ෂේත්‍රයෙන් ද පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ලබා තිබීම.

(*අ*) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව;

හෝ

(*ආ*) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව;

හෝ

(*ඇ*) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

හෝ

(*ඈ*) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්‍ෂණික ඩිප්ලෝමාව;

හෝ

(*ඉ*) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

හෝ

(*ඊ*) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

හෝ

(*උ*) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්‍ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්‍ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම.

5.3 කායික සුදුසුකම් :

සෑම අපේක්‍ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

***සටහන.***— සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

6.0 සාවද්‍ය තොරතුරු සැපයීම :

මෙම විභාගය සඳහා ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුව ද අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

7.0 විභාග පරිපාටිය :

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර, ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | | ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය | සමත් වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශතය |
|---|---|---|---|
| (i) | බුද්ධි පරීක්ෂණය | 100% | 40% |
| (ii) | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100% | 40% |

7.1 විෂය නිර්දේශය :

(i) බුද්ධි පරීක්ෂණය : අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත ය.

(ii) විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය :
ගණිතය :

වීජ ගණිතය (අසමානතා, විචල්‍ය, ශ්‍රේණි, ලඝුගණක)
ත්‍රිකෝණමිතිය (සමීකරණ, ත්‍රිකෝණ, විසඳීම)
සංඛ්‍යානය (මධ්‍යන්‍යය, මාතය, සම්මත අපගමනය, සම්භාවිතාව)

භෞතික විද්‍යාව :

ආලෝකය හා ප්‍රකාශ විද්‍යාව (පරාවර්තනය සහ වර්තනය : දර්පන වක්‍ර පෘෂ්ඨ, ප්‍රිස්ම කාච ප්‍රකාශ විද්‍යාවේ සූත්‍ර, අන්වීක්ෂය සහ දුරේක්ෂය) නිව්ටන් යාන්ත්‍ර විද්‍යාව (අදිශ සහ දෛශික, චලිතය පිළිබඳ නිව්ටන් නියම, ගම්‍යතාවය)

විවිධ මාතෘකා :
භූගෝල විද්‍යාව හැඳින්වීම (පෘථිවියේ හැඩය, භූ ලක්ෂණ ආදිය)
ඝණ වස්තුවල කෝණික දෘෂ්ඨිය සහ ප්‍රක්ෂේපණ ව්‍යුත්පන්න කිරීම.

8.0 තේරීම් පරිපාටිය :

8.1 සර්වේයර් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින්, පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු ගණනට සමාන අයදුම්කරුවන් ගණන, පළමුව ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල සහ දෙවනුව තනතුර සඳහා පළ කරන ලද මනාපය යන කරුණු දෙක අනුව බඳවා ගනු ලැබේ.

8.2 සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

9.0 බඳවා ගැනීම :

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනේ.

10.0 අයදුම්පත්‍ර සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :

(අ) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ. මී. 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම් පත්‍රය සකස් කරගත යුතු ය. අංක 01 සිට 05 දක්වා ශීර්ෂ 01 පිටුවේ ද, අංක 06 සිට 10.1 දක්වා ශීර්ෂ 02 පිටුවේද අංක 10.2-12.1 දක්වා ශීර්ෂ 03 පිටුවේ ද, අංක 13 සිට 15 දක්වා ශීර්ෂ 04 පිටුවේ ද, අංක 16 ශීර්ෂ 05 පිටුවේ ද, ඇතුළත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතු ය.

(ආ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වූවන් සිය ආයතන ප්‍රධානීන් මගින් ද නියමිත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුවේ.

(ඇ) ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් ය.

(ඈ) අයදුම්පත සමග ඔබගේ වෘත්තීය සුදුසුකම් තහවුරු කෙරෙන පාඨමාලා සහතිකවල සහතික කරන ලද පිටපත් එවිය යුතු ය.

(ඉ) නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතු ය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ඊ) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථානගතවන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

*සැ. යු.* .- විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10.1 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා 2016.08.29 දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට සර්වේයර් ජනරාල් විසින් ඉඩදෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම විභාගයට පෙනී සිටීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

10.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "තාක්‍ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

10.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

11.0 විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 800 කි. මෙම මුදල කොළඹ 05, කිරුල පාර, අංක 150 ස්ථානයේ පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට හෝ ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය-දියතලාව වෙත ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පතෙහි ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) කිසිම හේතුවක් නිසාවත්

විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාර ගනු නොලැබේ. රිසිට්පත් නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12.0 අයදුම්පත්‍ර යොමු කිරීම :

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2016 අගෝස්තු මස 29 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

සර්වේයර් ජනරාල්,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 506,
කොළඹ.

13.0 *විභාගයට පෙනී සිටීම* :
විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී ම විභාගයට පෙනී සිටිය යුතුය.

14.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :

විභාග ශාලාවේදී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත :

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සර්වේයර් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

පී. එම්. පී. උදයකාන්ත,
සර්වේයර් ජනරාල්.

2016 ජූලි මස 29 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**ආදර්ශ අයදුම්පත්‍රය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.

01. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය :

කොළඹ ☐

දියතලාව ☐

අනුරාධපුරය ☐

* විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත මධ්‍යස්ථානයේ නම සඳහන් කොටුව තුළ ✓ සලකුණ ද අනෙක් කොටු දෙක තුළ x සලකුණ ද යොදන්න.

02. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐
(සිංහල - S දෙමළ - T ඉංග්‍රීසි - E )
(දෙන ලද කොටු තුළ සංකේතය/අංකය යොදන්න.)

03. ඔබ අයදුම්කරනු ලබන තනතුර ඉදිරියෙන් ඇති කොටුව තුළ x ලකුණ යොදන්න :

| *අනු. අංකය* | *තනතුරු නාමය* | |
|---|---|---|
| 1 | ගොඩනැගිලි පරිපාලක | ☐ |
| 2 | ප්‍රවාහන නිලධාරි | ☐ |

04. මුල'කුරු සමග නම :—————. (මයා./මිය./මෙනවිය)
සිංහලෙන් :—————.
ඉංග්‍රීසියෙන් :—————.

04.1 මුල'කුරු වලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්) :
සිංහලෙන් :—————.
ඉංග්‍රීසියෙන් :—————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

06. උපන් දිනය :

අවුරුද්ද :—————. මාසය :—————. දිනය :—————.

06.1 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවු. :—————. මාස :—————. දින :————.

07. ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ - M ස්ත්‍රී - F) ☐

08. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) :—————.

08.1 ලිපිනය අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය : (උපලේඛනය 1 බලන්න)

දිස්ත්‍රික් අංකය : ☐ දිස්ත්‍රික්කයේ නම : ☐

08.2 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද? :—————.

09. දුරකථන අංකය : ස්ථාවර :—————. ජංගම :—————.

10. අධ්‍යාපන සුදුසුකම් :

10.1 අ. පො. ස. (සා. පෙළ.) විභාගය පිළිබඳ විස්තර :

*පළමුවර :*

(i) විභාග වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) සමත් වූ විෂයයන් :

වගුව - අංක 01 -

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

* ලබා ඇති ඉහළම ශ්‍රේණියේ සිට ශ්‍රේණි අනුපිළිවෙලින් විෂයයන් සඳහන් කරන්න.

10.2 අ. පො. ස. (සා. පෙළ.) විභාගය පිළිබඳ විස්තර :

*දෙවනවර :*

(i) විභාග වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) සමත් වූ විෂයයන් :

වගුව - අංක 02 -

| *විෂයය ** | *ශ්‍රේණිය* | *විෂයය ** | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

* ලබා ඇති ඉහලම ශ්‍රේණියේ සිට ශ්‍රේණි අනුපිළිවෙලින් විෂයයන් සඳහන් කරන්න.

10.3 අ. පො. ස. (උ.පෙළ.) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාග වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) සමත් වූ විෂයයන් :

වගුව - අංක 03

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

11. වෘත්තීය සුදුසුකම් :————.

12. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :

ඔව් : ☐ නැත : ☐

12.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :————.

13. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

14. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

(ඇ) රු. ......ක් ගෙවා ලබාගත් ලදුපත අදාල ස්ථානයේ අලවා ඇත.

(ඈ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් මැනුම්පති විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඉ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................. නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ...... දින මා ඉදිරිපිට දී ඉහත 13 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

16. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

16.1 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහ තුළ-
වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය.
සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත.
කිසිදු විනය දඬුවමකට ලක්ව නැත/ඇත.

16.2 ඉල්ලුම් කරනු ලබන තනතුරට තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය/නොහැකිය.
අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
නිල මුද්‍රාව.

දිනය :—————.

## උපලේඛනය 1

ආදර්ශ අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 08.1හි සඳහන් ලිපිනය අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය සඳහා මෙම ලේඛනය අදාළ වේ.

| නගරය/දිස්ත්‍රික්ක නාම | නගර/දිස්ත්‍රික්ක අංකය |
|---|---|
| 1. කොළඹ | 01 |
| 2. ගම්පහ | 02 |
| 3. කළුතර | 03 |
| 4. මහනුවර | 04 |
| 5. මාතලේ | 05 |
| 6. නුවරඑළිය | 06 |
| 7. ගාල්ල | 07 |
| 8. මාතර | 08 |
| 9. හම්බන්තොට | 09 |
| 10. කුරුණෑගල | 10 |
| 11. පුත්තලම | 11 |
| 12. අනුරාධපුර | 12 |
| 13. පොළොන්නරුව | 13 |
| 14. බදුල්ල | 14 |
| 15. මොණරාගල | 15 |
| 16. රත්නපුර | 16 |
| 17. කෑගල්ල | 17 |
| 18. අම්පාර | 18 |
| 19. මඩකළපුව | 19 |
| 20. ත්‍රිකුණාමලය | 20 |
| 21. යාපනය | 21 |
| 22. වවුනියාව | 22 |

07-1192

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

**ISO** 9001 : 2008 තත්ත්ව සහතිකයෙන් පිදුම් ලත් ආයතනයකි

**(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලදී)**

*නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය*

ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2016 - **Courses in Graphics, Multimedia and Printing - 2016**

ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයන්ට අදාළ පාඨමාලා හඳුන්වාදීමේ අද්විතීය ස්ථානයක් ලබා සිටින ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය එම ක්ෂේත්‍රයට අදාළ දැනුම, හැකියා, දක්ෂතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම සඳහා මුළුමනින්ම කැපවී කටයුතු කරයි. පහත සඳහන් පාඨමාලාවලට බඳවා ගැනීම දැන් ආරම්භ කර ඇත.

**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව -**

**Training Programme in Offset Lithopress Operation for School Leavers (Full Time) : NVQ LEVEL 3**

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩ සටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුලු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. එක් පුහුණු කණ්ඩායමකට බඳවා ගනු ලබන්නේ 10 දෙනෙකුගෙන් සමන්විත කුඩා කණ්ඩායම් නිසා සීමාසහිත අපේක්ෂකයන් සංඛ්‍යාවක් පමණක් සම්මුඛ පරීක්ෂණයක් ආධාරයෙන් තෝරාගනු ලැබේ.

**පුහුණු ක්‍රමය :** මාස 2ක කාලයක් පූර්ණ කාලීනව ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම ලබාදීම ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ සිදු කෙරේ, ඉන් අනතුරුව මාස 12ක් මුද්‍රණාලයකට අනුයුක්ත කොට පූර්ණ කාලීන ප්‍රායෝගික පුහුණුවක් ලබාදෙන අතර මෙම කාලය තුළ සතියකට වරක් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ වර්ණ යන්ත්‍ර ආශ්‍රිතව ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම වර්ධනය වන අයුරින් විශේෂ පංති පැවැත්වේ. මෙම පාඨමාලාව සම්පූර්ණ කරන සිසුන්ට රජය පිළිගත් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ සහතිකයක් ලැබෙන අතර NVQ - 3 මට්ටමේ සහතිකයක්ද ලැබේ.

**පාඨමාලා කාලය : මාස 14යි (පූර්ණකාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 21,500**

**මයික්‍රොසොෆ්ට් ඔෆීස් - MS Office :**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පුලුල් අවබෝධයක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙන අතර පරිගණකය පිළිබඳව මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසැල් හැරගිය නවකයින්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා ගැනීමට කැමති සියලු දෙනාට පොදුවේ ප්‍රයෝජනවත් පාඨමාලාවකි.

**පාඨමාලා කාලය : මාස 4යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 11,500**

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පරිගණක ආශ්‍රිත මුද්‍රණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**
**Computer Typesetting & Layout Designing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මෙම පාඨමාලාව මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස් වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි. පරිගණක ආධාරයෙන් අකුරු ඇමිණීම පිළිබඳව පුලුල් අවබෝධයක් මින් ලබා දෙන අතර මුල සිටම පරිගණක දැනුම, පරිගණක භාවිතය සහ මෘදුකාංග අධ්‍යයනය පිළිබඳව මනා දැනුමක් ලබා දේ.

**පාඨමාලා කාලය : මාස 5යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 13,000**

**පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course in Computer Graphic Design**

අද රැකියා අංශයේ ඉතා ඉහළ ඉල්ලුමක්ව පවතින මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයට යොමු වීමට අවශ්‍ය දැනුම ලැබෙන අයුරින් මෙම පාඨමාලාවේ අන්තර්ගතය සකසා ඇති අතර ඉතා පුළුල් පුහුණු කාලයක් තුළ සෑම ශිෂ්‍යයෙකුටම ඵලදායීතාවයක් ලැබෙන අයුරින් විෂය නිර්දේශය සකසා ඇත. පරිගණක ආශ්‍රිත නිර්මාණකරනයට උනන්දුවක් දක්වන නවකයන්ටත් ග්‍රැෆික්ස්, ප්‍රචාරක මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රවල නියැලි පුද්ගලයන්ටත් මෙම පාඨමාලාව ඉතා ඵලදායී වනු ඇත. මෙම පාඨමාලාව හැදෑරීමෙන් ග්‍රැෆික් මෘදුකාංග පිළිබඳ මෙන්ම ග්‍රැෆික් නිර්මාණය පිළිබඳව ඉතා පුළුල් දැනුමක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලැබේ.

ඉහත පාඨමාලා සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර දැන් බඳවා ගැනීම ආරම්භ කොට ඇත.

**පාඨමාලා කාලය : මාස 5යි (අර්ධකාලීන)** **මාධ්‍යය : සිංහල** **ආයතනික පාඨමාලාව : රු. 15,350**
**NVQ-4 මට්ටම පාඨමාලාව රු. 20,500**

**ඕෆ්සෙට් පත්ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණය - SHEETFED LITHOPRESS**

මෙම පාඨමාලාව තුළින් පත්ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුළුල් අවබෝධයක් හා මනා ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ. මාස 8ක පමණ කාලයක් පුරා සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙන මෙම අර්ධකාලීන පාඨමාලාව න්‍යායාත්මක හා ප්‍රායෝගික පංති වලින් සමන්විත වේ. මෙම පාඨමාලාව ක්ෂෙත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම මුද්‍රණ ක්ෂේත්‍රයට ඇතුළත් වීමට උනන්දුවක් දක්වන නවකයන්ට ද සුදුසු වන අයුරින් පාඨමාලා අන්තර්ගතය සම්පාදනය කොට ඇත.

**පාඨමාලා කාලය - මාස 08 - (අර්ධකාලීන)** **මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි** **පාඨමාලා ගාස්තුව රු. - 16,500**

**වෙබ් අඩවි නිර්මාණකරණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබාදෙන අතර නවීන තාක්‍ෂණයට අනුකූලව පාඨමාලා අන්තර්ගතය සකස් කර ඇත. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම පරිගණක ආශ්‍රිත පාඨමාලා හදාරණ සිසුන්ට ද මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයින්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

**පාඨමාලා කාලය - මාස 5යි - (අර්ධකාලීන)** **මාධ්‍යය - සිංහල /ඉංග්‍රීසි** **පාඨමාලා ගාස්තුව - රු. 16,000**

**ත්‍රිමාණ සජීවිකරණය පිළිබඳ පාඨමාලාව - Digital Animation**

අද ප්‍රචලිතව පවතින සජීවිකරණ මෘදුකාංග ඇසුරෙන් ද්විමාන සහ ත්‍රිමාන චලන රූප නිර්මාණය කර ඒවා චිත්‍රපට, රූපවාහිනී සහ වෙනත් වීඩියෝ කාර්‍යයන්ට භාවිතා කරන අයුරු මෙම පාඨමලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ. මේ සඳහා උනන්දුවක් දක්වන නවකයන්ට මෙන්ම එම අදාළ ක්ෂේත්‍රවල නියැළි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

**පාඨමාලා කාලය - මාස 06 (අර්ධ කාලීන)** **මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි** **පාඨමාලා ගාස්තුව - රු. 21,500**

**ආංකික පෙර මුද්‍රණය - DIGITAL PRE PRESS**

මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරණ හා ප්‍රකාශන ක්ෂේත්‍රයන්හි යෙදී සිටින සේවක මහතුන්ට මෙම පාඨමාලාව අතිශයින් ප්‍රයෝජනවත් වනු ඇත. නවීන පෙර මුද්‍රණය පිළිබඳ පුළුල් අවබෝධයක් ලැබෙන අයුරින් මෙම පාඨමාලාව සකස් කර ඇති අතර මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රවලට අදාළ වෘත්තිකයන් විසින් මෙම පාඨමාලාවේ දේශන පවත්වනු ලැබේ.

**පාඨමාලා කාලය - වසරයි (අර්ධ කාලීන)** **මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි** **පාඨමාලා ගාස්තුව - රු. 20,500**

**මුද්‍රණය සඳහා ග්‍රැෆික්ස් නිර්මාණ සැකසුම - DESIGN FOR PRINT**

මුද්‍රණ රටා නිර්මාණකරණයේ දී ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටලු මෙන්ම රටා නිර්මාණකරණ සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් මේ තුළින් ලබාදේ. පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණ ජාත්‍යන්තර මට්ටමට නිර්මාණකර ඒවා මුද්‍රණයට සුදුසු ලෙස සකසන අයුරු පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ.

**පාඨමාලා කාලය - වසරයි (අර්ධ කාලීන)** **මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි** **පාඨමාලා ගාස්තුව - රු. 13,500**

web : www.sliop.edu.lk

විමසීම් - ප්‍රධාන කාර්යාලය :-
ලේඛකාධිකාරි, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.
දුරකථන : 011 2686162, 011 2679791
ෆැක්ස් : 011 2686162, ඊමේල් : sliopreg@sltnet.lk
web : www.sliop.edu.lk

මාතලේ ශාඛාව :
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
දිසා ලේකම් කාර්යාලය - මාතලේ.
දුරකථනය : 066 2222172
ජංගම : 071 0554298

07-1135

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.